# කෙතට පෝර ගෙදරින් දෙන කොම්පෝස්ට්

කොම්පෝස්ට් පෝර සකස් කිරීම සඳහා ගෙවත්තෙන්, කුස්සියෙන් ඉවත ලන එළවළු පළතුරු කැබලි, අළු, වල් පැලෑටි, සුන්බුන් ආදිය සහ ගව මී හරක්, එළුවන් හා කුකුළන් ගේ මල ද්‍රව්‍යයන් ප්‍රයෝජනයට ගනු ලැබේ. ගොම හෝ වෙනත් මල ද්‍රව්‍ය ලබා ගත නොහැකි නම් ඒ සඳහා මද වශයෙන් වේලන ලද අමු කොළ යොදන්නට හැක. කොම්පෝස්ට් කරන ද්‍රව්‍ය වලින් 1/3 අමු කොළ හා නොමේරූ නැටි හා දඬු විය යුතු ය.

**පෝර සෑදීම**: මීට ක්‍රම දෙකක් තිබේ. පළමුවැන්න ගොඩ ක්‍රමය යි. දෙවැන්න වල ක්‍රමය යි. ගොඩ ක්‍රමයේ දී කොම්පෝස්ට් කරවන ද්‍රව්‍ය අඩි 3–4 දක්වා වන ලෙස පොළව මතු පිට ගොඩ ගසනු ලැබේ.

වල ක්‍රමයේ දී මුදුනෙන් අඩි 3 ක් පළල ගැඹුර අඩි 2 ක් පමණ වන පරිදි වලක ද්‍රව්‍ය තැන්පත් කරනු ලැබේ. වලේ පැති කැපිය යුත්තේ ඇලයකට යි. මුදුනත් පතුලත් අතර අඩියක පරතරයක් තිබීම සුදුසුය. වැසි ජලය රැඳෙන්නට ඉඩ නොතබන්න. මේ සඳහා වලේ පතුල පැත්තකට බෑවුම් වන්නට කැපීම අවශ්‍ය ය. එසේ ම කසල ද්‍රව්‍ය පෙරලීමට හැකි වන පරිදි වලින් පැත්තක සෑහෙන ඉඩ තැබීම අවශ්‍ය වේ.

දැන් කොම්පෝස්ට් කරන ද්‍රව්‍ය ගොඩ ගසා ගන්නේ කොහොම දැයි බලමු. රළු ද්‍රව්‍ය, තුනී තට්ටුවක්, ඊට පසු අමු කොළ හෝ ගොම සහ අළු තට්ටුවක් වශයෙන් මාරුවෙන් මාරුවට තැන්පත් කරන්න. මේවා මතුපිටට අමු ගොම සහ වතුර දියාරු මිශ්‍රනයක් ඉසීම සුදුසු ය.

මේ ද්‍රව්‍ය කලින් කලට පෙරලන්නට අවශ්‍ය ය. පළමු පෙරලීම සති 2 කට පසුවත් දෙවන පෙරලීම ඉන් සති 2 කට පසුවත් තුන්වන පෙරලීම ඉන් සති 4 කට පසුවත් කරනු ලැබේ. මෙසේ අවසාන වරට පෙරලුවාට පසුව කොම්පෝස්ට් ද්‍රව්‍ය අඩි 4 ක් පමණ උසට ගොඩ ගසා තිබෙන්නට ඉඩ හරින්න. උවමනා යයි සිතන හැම වාරයකමත්, පෙරලන හැම වාරයකමත් කොම්පෝස්ට් ද්‍රව්‍ය තෙත්ව තබා ගන්න. ඊට වතුර වක් කරන්න. නමුත් වතුර වැඩිපුර යොදන්න හොඳ නැහැ. තවද, වැස්සෙන් තද අව්වෙන් වන හානි වලක්වා ගන්නට වලවල් හෝ ගොඩවල් මත පොල් අතු වලින් ආවරණයක් තැනීම සුදුසු යි.

මුල් සති දෙක තුළ දී, කොම්පෝස්ට් කරන කසල ද්‍රව්‍යවල උෂ්ණත්වය පැ. 140 දක්වා පමණ වැඩි වන්නට අවශ්‍ය ය. එවිට ද්‍රව්‍ය වල තිබෙන වල් පැලෑටිවල බීජ, මැසි පිලවුන් සහ පලිබෝධකයින් විනාශ වේ.

මෙලෙස ඉහත සඳහන් කළ ක්‍රම දෙකෙන් ම මාස 3 ක කාලයක දී කොම්පෝස්ට් පෙන් පිළියෙල කර ගන්නට පුළුවනි. සාද ගත් පෝර ඉක්මණින් ප්‍රයෝජනයට ගැනීම සුදුසුය.

## යොදන ප්‍රමාණය

බෝගයක් වපුරන්නට හෝ සිටුවන්නට සති 2 කට කලින් යොදන්න. ගෙවතු වගා වටා වර්ග අඩියකට පෝර රාත්තල් 1/2 – 1ක් සෑහේ. විශාල වශයෙන් කෙරෙන වගාවකට අක්කරයකට ටොන් 10–20 ක් පමණ අවශ්‍ය වේ. එහි බර තෙතමනය අනුව වෙනස් වන අතර, සාමාන්‍යයෙන් කොම්පෝස්ට් පෝර ඝන අඩියක් රාත්තල් 40 – 50 ක් පමණ වේ.